# බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අපේ විරුද්ධතාව - ප්‍රභාකරන් රනිල් හා හකීම්

ඉඒදා දිවයින සංග්‍රහයට සතිපතා ලියැවෙන මේ ලිපි පෙළ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ දාසයන්ගේ වෛරයට හේතුවන බව අපි දනිමු. සිංහල පුවත්පත්වලට සතිපතා ලියැවෙන තීරු ලිපි රාශියක් තිබිය දී ඒ තීරු ලිපිවලින් අතිවිශාල බහුතරය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ පැවැත්ම වෙනුවෙන් ලියැවෙද්දී මේ ලිපිය ලිවීමට ඉඩදීම පිළිබඳව දිවයින ඉරිදා සංග්‍රහයෙහි සංස්කාරකවරයාට වගඋත්තර බැඳීමට සිදුවීමෙන් හා අනෙක් සංස්කාරකවරුන්ට එවැනි අවශ්‍යතාවක් ඇති නොවීමෙන් පෙන්නුම් කෙරෙන්නේ  කුමක් ද යන්න ඉතා පැහැදිලි ය. එසේ වගඋත්තර බැඳීමට සිදු වී ඇත්තේ එක්තරා රූපවාහිනි නාලිකාවක මා සිතන අයුරින් නම් සතිපතා ප්‍රචාරයවන වැඩසටහනක දී ය. මම මේ වැඩසටහන තබා නාලිකාවවත් නො නරඹමි. එබැවින් මේ වැඩ සටහන සතිපතා ප්‍රචාරයවන්නක් දැයි නිශ්චිත ව නො දනිමි. පසුගිය සතියේ ප්‍රචාරය වූ වැඩ සටහන අවසානයේ දී දෙතුන් දෙනකු ඒ පිළිබඳ ව මට දැනුම් දුන් බැවින් මම ඒ ගැන දැනගතිමි. මේ දෙරණ මත හිඳිමින් දේශීයත්වයක් ගැන කතාකරන රූපවාහිනී නාලිකාවක දේශීයත්වයට විරුද්ධ අයට (සතිපතා) වැඩ සටහන් ලබාදීම ගැන අපි ප්‍රශ්න නො කරමු. අද ව්‍යාජ දේශීයත්වය ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වය පවත්වාගෙන යෑමේ උපායක් බවට පත් වී ඇත. මේ ව්‍යාජ දේශීයත්වය ගැන කතාකරන අය අපට අවුරුද්දකට වතාවක්වත් වැඩසටහනක් ලබා නො දෙන නමුත් දිවයින ඉරිදා සංග්‍රහයෙහි බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි දාසයන්ට ද ඉඩකඩ සැපයෙයි. එහෙත් එසේ වැඩ සටහන් ලබාදීම ගැන ප්‍රශ්නකිරීම අර වැඩ සටහන පවත්වාගෙන යන්නාගේ බංකොලොත් තත්වයට අප ද පත්වීමකි.  මේ තීරු ලිපිය පළකිරීම පිළිබඳ ව ප්‍රශ්න කරන්නෝ එසේ කිරීමෙන් තමන් මහා ඉහළින් රකින්නේ යැයි කියන මාධ්‍ය නිදහස යනු තමන්ට අවශ්‍ය දේ පළකිරීමට ඇති නිදහස පමණක් බව හඬගා කියති.

සතියකට බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට පක්ෂව ලිපි රාශියක් ලියැවුණ ද ගුවන් විදුලි නාලිකාවල හා රූපවාහිනී නාලිකාවල බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ දාසයන් වැඩසටහන් රාශියක් ප්‍රචාරය වුව ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට එරෙහිව සවිඥානික ව ලියන මේ තනි ලිපිය බයිලා කතුවරයාගේ සිට බොහෝ අයට හිසරදයක් වී ඇති බව පැහැදිලි ය. එකී මෙකී සියළු දාසයන්ගේ ප්‍රශ්න කිරීම් මැද මගේ ලිපිවලට ඉඩ දීම පිළිබඳ ව උපාලි පුවත්පත් සමාගමටත් ඉරිදා දිවයින, විදුසට සහ දි අයිලන්ඩ් පුවත්පත් සංස්කාරකවරුන්ටත් මගේ කෘතඥතාව හිමි වෙයි. ලිපි තුනක්  ලියා බටහිර ක්‍රිස්තියානි නූතනත්වය නම් මහා බලකොටුව බිඳීමට වෑයම්කිරීම වල්ගයෙන් සාගරය සිඳ දැමීමට කටයුතු කළ ලේනාගේ කියාවට සමාන යැයි කෙනකුට සිතිය හැකි ය. ඒ එසේ වන්නට හැකි ය. විශේෂයෙන් ම ජාතිකත්වය ගැන කතාකරන බොහෝ නායක කාරකාදීන් ද ලිපි පෙළ අගය නොකරන බැවින් ද ඔවුන් විසින් ඒ ගැරඬි හැවක් සේ සලකා ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති බැවින් ද ඒ එසේ ම වීමට ඇති ඉඩ අධික ය. එහෙත් මේ ලිපි පෙළ කියවන ජාතිකත්වය අගය කරන සාමාන්‍ය ජනයා ඉන් යම් දැනුමක් ලබාගන්නා බව පෙනෙන්නට ඇත. අඩුම තරමින් ඔවුන් වෙනුවෙන් ලිපි පෙළ ලිවිය යුතු ව ඇත.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වය යන යෙදුම බොහෝ දෙනා අතර තවම ප්‍රචලිත නොවුණ ද මේ ලිපි පෙළින් හඳුන්වා දෙනු ලැබූ ඇතැම් වචන හා යෙදුම් මේ වන විට මෙරට දේශපාලනයට හා වෙනත් සංවාදවලට ඇතුල් වී ඇත. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය යන්නෙන් කියැවෙන්නේ සංස්කෘතික හා දේශපාලනික ප්‍රපංචයක් මිස ආගමික වූවක් නො වෙයි. අප විසින් ගොඩ නගනු ලැබ ඇති ප්‍රවාදවලට අනුව ආගමකට වඩා සංස්කෘතියක් මූලික වෙයි. ඉන් කියැවෙන්නේ මූලික වශයෙන් ගත්කල ආගමක් සංස්කෘතියක බිහිවන බව ය. එසේ බිහි වූ ආගමක් මගින් කල්යෑමේ දී සංස්කෘතිය ද යම් ප්‍රමාණයකට වෙනස් කෙරෙන බව පැහැදිලි ය. ඒක රේඛීය නොවන චක්‍රීය චින්තනයක් වූ සිංහල බෞද්ධ සංස්කෘතියෙහි නිර්මාණය වන ප්‍රවාදවල එවැනි චක්‍රීය ලක්ෂණ තිබීම පුදුමයක් නොවිය යුතු ය. කතෝලික නොවන ක්‍රිස්තියානි ආගම් නිර්මාණය වී ඇත්තේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ය.

එමෙන් ම බුදු දහමින් කියැවෙන දැනුම හා ඒ ආශ්‍රිත පූජා විධි බිහි වී ඇත්තේ ආර්යයන් දඹදිව ආක්‍රමණය කර ඒ භාරතය බවට පත්කිරීමට පෙර තිබූ අනාර්ය සංස්කෘතියක ය. මෙහි අනාර්ය යනුවෙන් කියැවෙන්නේ ද්‍රවිඩ යන්න නොවන බව නැවත නැවතත් අවධාරණය කළ යුතුව ඇත. ද්‍රවිඩයන් භාරතයට පැමිණ ඇත්තේ ආර්යයන්ගේ පැමිණීමෙන් අවුරුදු දහසකට පමණ පසුව ය. (ආර්යයන් පැමිණියේ දඹදිවට ය. ඔවුහු දඹදිව භාරතය බවට

© Prof. Nalin De Silva

පත්කළහ. ද්‍රවිඩයන් පැමිණ ඇත්තේ මූලික වශයෙන් ම භාරතයට මිස දඹදිවට නො වෙයි. භාරතය ඉන්දියාව බවට පත්කිරීමට මුල පිරුවෝ මුස්ලිම් ආක්‍රමණිකයෝ ය. ඉංගිරිසිහු ඒ ක්‍රියාදාමය පරිපූර්ණත්වයකට ගෙන ආහ. මොහෙන්ජදාරෝ හරප්පා සභ්‍යත්ව ප්‍රාග් ආර්ය සමාජයක, එනම් අනාර්ය සමාජයක නිර්මාණය වී ඇත. කාලයක් තිස්සේ අප මේ පිළිබඳ ව ලියන නමුත් තවමත් ඒ කරුණු සමාජයේ ව්‍යාප්ත වී නැත. එයට එක් හේතුවක් වී ඇත්තේ සිංහලයන් බුදුන් වහන්සේ ද, තමන් ද ආර්යයන් ලෙස සැලකීම ය. බුදුන් වහන්සේ ආර්යයන්ගේ බ්‍රාහ්මණ, ආර්ය වැනි වචනවලට වෙනත් තේරුම් දී ඒ වචනවලට එකල සමාජයෙහි දී තිබූ අගය හා වැදගත්කම පවා වෙනස් කළහ. ඇතැම් පුරාවිද්‍යාඥයන් ලංකාවේ හා ඉන්දියාවේ ඈත අතීතය ද්‍රවිඩයන්ට පැවරීමට කටයුතු කරන්නේ ප්‍රාග් ආර්ය අනාර්යයන් ද්‍රවිඩයන් ලෙස සැලකීමෙනි.) කෙසේ වෙතත් බුදු දහම නිර්මාණය වී ඇත්තේ ප්‍රාග් වෛදික අනාර්ය සංස්කෘතියක ය. ලෞකික වශයෙන් ගතහොත් බුදුන් වහන්සේ ආර්යයන් විසින් බිහිකරන ලද වෛදික සංස්කෘතිය වෙනුවට නැවතත් ප්‍රාග් වෛදික අනාර්ය සංස්කෘතිය පැතිරවීමට කටයුතු කළහ.

මාටින් ලූතර්, කැල්වින් ආදී ප්‍රොතෙස්තන්ත ව්‍යාපාරයේ නායක පූජකවරු බිහිවීමට පෙර ම යුරෝපීය කතෝලික වැඩවසම් සංස්කෘතියට එරෙහිව ක්‍රිස්තියානි සංස්කෘතියක් බිහිවීම ඇරඹී තිබුණි. බටහිර ඉතිහාසඥයන් පුනරුදය යනුවෙන් හඳුන්වන්නේ මේ ක්‍රියාවලිය ය. ඒ මුල දී චිත්‍ර කලාවෙහි හා මූර්ති ශිල්පයෙහි විප්ලවයක් ලෙස ඇරඹුනි. මිචලාංජිලෝ, ලියනාදෝ දා විංචි ආදීහු එහි ප්‍රමුඛත්වය ගත්හ. අප දකින ආකාරයට සංස්කෘතික හා චින්තන විප්ලවයක් වූ මේ ක්‍රියාවලියෙහි සංකේතය මිචලාංජිලෝ විසින් අවුරුදු පන්සියයකට පෙර නිර්මාණය කරන ලද ඩේවිඩ් ප්‍රතිමාව ය. මේ ක්‍රියාවලියෙහි ඒ ඒ අවස්ථාවල කතෝලික නොවන ක්‍රිස්තියානි ආගම් ද, බටහිර විද්‍යාව ද, ධනපති ක්‍රමය ද, එහි ඊනියා ලිබරල් ප්‍රභේදය ද, (කාර්මික) තාක්ෂණික විප්ලවය ද, ඉලෙක්ට්‍රොනික විප්ලවය ද, අද වන විට පරිගණකය ඇසුරෙන් තොරතුරු තාක්‍ෂණය ද ඇති වී තිබේ. ක්‍රියාවලියෙහි දේශපාලන නායකත්වය එයට තරමක් සමාන්තර ව  ඉතාලියෙන් ස්පාඤ්ඤයට හා පෘතුගාලයට ද, එතැනින් එංගලන්තයට ද, වර්තමානයේ දී ඇමරිකා එක්සත් ජනපදයට ද  හිමි වී ඇත. ඇතැමුන් ඊනියා පශ්චාත්නූතනත්වයක් ගැන කතා කළ ද බටහිර ක්‍රිස්තියානි නූතනත්ව ක්‍රියාවලිය තවමත් අවසන් වී නැත. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ පදනමේ ඇත්තේ පෞද්ගලිකත්වය ඉස්මතු කිරීම, ඉන්ද්‍රිය පිනවීම, ඒ සඳහා අවස්ථා සපයා දීම, පුද්ගලයා සමාජයෙන් හා පරිසරයෙන් ද අවසානයේ දී තමන්ගෙන් ද වෙන් කිරීම, වෙන්කිරීම, සංස්ලේෂණය වෙනුවට අසීමිත විශ්ලේෂණය, සමජයෙහි පරමාණුකරනය, සාමූහිකත්වය වෙනුවට තරගය, ඇරිස්ටෝටලීය න්‍යාය (ලොජික්) යොදාගැනීම, වියුක්ත චින්තනය, සාධාරනීකරණය, ඌනනය හා ග්‍රීක ස්වසිද්ධාත්මක ක්‍රමය යොදාගැනීම, තම සංස්කෘතිකාංග අනෙක් අය මත බලයෙන් පැටවීම ආදිය ය. මේ සියල්ල සමග කතෝලික සංසාකෘතියට වුව ද පැහීමක් නැත. එවිට ථෙරවාද බෞද්ධ, මුස්ලිම්, හින්දු ආදී සංස්කෘතීන් සමග බටහිර ක්‍රිස්තියානි නූතනත්වය සංසන්දනය කිරීම තේරුමක් නැති ක්‍රියාවක් බවට පත්වෙයි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට කිසි දිනෙක පරිසරය රැකීමට නො හැකිය. පරිසරය යහපත් ව පවත්වාගෙන යැමට නම් ලෝකය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙන් නිදහස් විය යුතු ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය සිය සංස්කෘතිය දේශපාලනය හා ආර්ථිකය අනෙක් සමාජ මත බලයෙන් පැටවීමට කටයුතු කරයි.

අප බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට විරුද්ධවන්නේ මේ සියළු කරුණු නිසා මිස බයිලා කතුවරයා කියන අයුරින් සුද්දාට දීම යන ආකල්පයෙන් නො වේ. අප මියන්මාරයේ බටහිරයන් කරන කියන දේට විරුද්ධවන්නේ ද ඒ අරුතින් මිස ඊනියා ප්‍රජාතන්ත්‍ර විරෝධී ආණ්ඩුවක් රැකීම සඳහා නො වේ. බයිලා කතුවරයාට අනුව අප පිටරටක ඉපදිණි නම් ප්‍රභාකරන්ගේ ම්ලේච්ඡ ක්‍රියා අනුමත කරනු ඇත. ඔහුගේ තර්කන ඥානය පිළිබඳ කණගාටු වීම හැරෙන්නට අපට කළහැකි අන්කිසිවක් නැත. අද ප්‍රභාකරන් පවත්වාගෙන යනු ලබන්නේ බටහිරයන් විසිනි. අප පිටරටක නොව ලංකාවේ දෙමළ පවුලක ඉපදුන ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට විරුද්ධවන්නන් ලෙස ප්‍රභාකරන්ට හා කොටි සංවිධානයට විටැද්ධවීමට තිබුණි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ මෙරට ප්‍රධාන නියෝජිතයන් වනුයේ එ ජා පක්‍ෂය හා රනිල් වික්‍රමසිංහ මහතා ය. ප්‍රභාකරන් මෙන් ම හකීම් මහතා ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ නියෝජිතයෝ වෙති. හකීම් මහතා ආගමින් ඉස්ලාම්  වුව ද පසුබිමෙන් හා අධ්‍යාපනයෙන් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අයත් වෙයි. ඔහු තමන්ට අවශ්‍ය දේ ලබාගෙන ආණ්ඩුවෙන් ඉවත්විය. මේ ලිපිය පළවන විට ආණ්ඩුවේ ඉරණම තීරණය වී හමාර ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට එරෙහිව ජාතික බලවේග නිසි අයුරින් ක්‍රියාත්මක වී යැයි සිතමු.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva